දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල  - **2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජර්නල් සටහන් පිළියෙල කර සහතික කිරීමෙන් තොරව ගිණුම් ශේෂ ගැලපීම හා පියවීම, ලෙජරයට පිටපත් කිරීම , ගිණුම් තැබීමේ අඩුපාඩු නිවැරදි කිරීම යනාදී ගිණුම්කරණ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. | ඉදිරියේදී අවසන් ගිණුම් සකස් කිරීමේදී සහතික කරන ලද ජනල් සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | සහතිකකළ ජර්නල් සටහන් මත ගිණුම්කරන කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) ගනුදෙනු පිටපත් කිරීමේදී අපැහැදිලි හා විධිමත් නොවන ලෙස ප්‍රධාන ලෙජරය පවත්වා තිබුණි. | නිලධාරී පුරප්පාඩු හේතුවෙන් රාජකාරි පහසු කිරීම සඳහා එක්සෙල් මෘදුකාංගය භාවිතා කර විධිමත් ආකෘතියකට පොදු ලෙජරය සකස් කර ඇති නමුත් ලෙජර් පිටුව සටහන් වී නොමැති බව හා ඉදිරියේදී ලෙජර් ආකෘතිය භාවිතා කර ගනුදෙනු ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රධාන ලෙජරය ක්‍රමානුකූලව පවත්වාගත යුතුය. |
| (ඇ) ගනුදෙනු වලට අදාල වවුචර් අංක , චෙක්පත් අංක යනාදී විස්තර මකා දමා වෙනස් කිරීම් සිදුකර විනිවිදභාවයකින් තොරව මුදල් පොත පවත්වා තිබුණු අතර එකී සංශෝධනයන් වගකිව යුතු නිලධාරියෙකු සහතික කර නොතිබුණි. | චෙක්පත් අංක ප්‍රමාද දෝශයකින් වෙනස් වී තිබීම මත නිවැරදි කිරීම් කර ඇති අතර වෙනස් කිරීම් වලට වෙනම අත්සන් යොදා නොමැති බවත්, ඉදිරියේදී මෙවැනි ගැටලු ඇති නොවන ආකාරයට කටයුතු කරන බව දන්වමි. | මුදල් පොත නිවැරදි ලෙස හා විනිවිදභාවයකින් පැවැත්වීමට හා එහි සංශෝධනයන් සඳහා වගකිව යුතු නිලධාරියෙකු අත්සන් තබා සහතික කළ යුතුය. |

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයන් 02කට අදාලව එකතුව රු.198,000ක් වූ උපචිත වියදම් වෙනුවෙන් ප්‍රමිත 1 ප්‍රකාරව ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | කලමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | උපචිත වියදම් වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සැලසිය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරනරාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(1) ඡේදයෙන් ඇතුලත් කළ මුදල් රෙගුලාසි 877 (2) (ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අරමුදලේ කාර්යය සාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. අරමුදලේ කාර්යය සාධනය සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යය සාධන වාර්තාවේ දැක්වෙන බව අරමුදලේ ලේකම්වරයා විගණනයට දන්වා තිබුණ ද එකී කාර්යය සාධන වාර්තාවේ දක්වා තිබුණේ අරමුදලේ කාර්යය හා කර්තව්‍ය මොනවාද යන්න පමණකි. | කලමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | අරමුදලේ කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරීමට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1992 අංක 09 දරන ආශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාරඅරමුදලේ පනතේ 6(2) (1) (ඇ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අතිරික්ත මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුව තිබුණ ද , ඉකුත් වර්ෂ 05ක කාලය තුල ලබාදී තිබුණු රජයේ ප්‍රදාන | 2022 වර්ෂයේ දී අරමුදලේ ජංගම ගිණුමේ අතිරික්තව ඇති මුදලින් රු.2,000,000.00 ක මුදලක් එම ගිණුමෙන් ඉවත් කර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමටද කටයුතු | අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර අරමුදලේ මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වලින් උපයෝජනය නොකල අරමුදල් බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබූ මුදල් ශේෂය පිළිවෙලින් රු.1,669,108, රු.2,451,803, රු.2,229,765,රු.3,395,003ක් හා රු. 3,032,020 ක් විය. මෙම අතිරික්ත මුදල් ශේෂයන් සුරැකුම්පත්වල හෝ වෙනත් ආයෝජන මාර්ගයක ආයෝජනය කර අරමුදලේ මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කර ඇත. තවදුරටත් අතිරික්ත මුදලක් වේ නම් ඒවා ඉදිරියේදී ආයෝජනය කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.275,050ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.372,844 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.97,794 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ආදායම රු.2,101,697ක වර්ධනයක් තිබුණු නමුත් ඊට සාපේක්ෂව අධ්‍යාපන හා සංස්කෘතික හා පුනරුත්ථාපන ආධාර යනාදී වියදම් පිළිවෙලින් රු.2,041,085 කින් හා රු.630,288 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ පුනරුත්ථාපනය හා සුභසාධනය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවකින් හා විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය , වයස් ව්‍යුහය, දෘශ්‍යාබාධිත තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම, නිශ්චිත නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. | සමස්ත දිවයිනම ආවරණය වන පරිදි දත්ත පද්ධතියක් සකස් කිරීම ඉතා සංකීර්ණ කාර්යයකි . ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ,භෞතික , සහ මානව සම්පත් අරමුදල සතුව නොපවතී. මේ හේතුවෙන් නිසා අරමුදල විසින් දැනට භාවිතා කරනුයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කර ඇති දත්තයන්ය. | දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) පළමු වසරේ සිට අ.පො.ස (සා.පෙළ) දක්වා ඉගෙනුම ලබන දරුවන්, උසස් පෙළ හදාරන දරුවන්, විශ්වවිද්‍යාලීය දරුවන් සහ ලුවී බ්‍රේල් නමින් දෘශ්‍යාබාධිත දෙමව්පියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන්ට අරමුදල මඟින් සිදුකර තිබූ අධ්‍යාපන ආධාර වශයෙන් ශිෂ්‍යාධාර ලබාදීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිත දරුවන්ගේ සංඛ්‍යාව හඳුනාගැනීමට අදාලව දත්ත පද්ධතියක් පවත්වා නොතිබුණි. | සීමිත සම්පත් තුළ දිවයිනම ආවරණය වන පරිදි දත්ත පද්ධතියක් පැවැත්වීමේ හැකියාව සීමා වන අතර එසේ වුවද දිවයිනම ආවරණය වන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. | දත්ත පද්ධතියක් සකස් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි වූ ශිෂ්‍ය ,ශිෂ්‍යාවන් 21 දෙනෙකු සඳහා වර්ෂයට අදාල ගෙවිය යුතු ශිෂ්‍යාධාර රු.269,000ක මුදලක් ගෙවීම්කර නොතිබුණි. තවද, තෙවන හා සිව්වන කාර්තු සඳහා සිසුන් 07 දෙනෙකු වෙනුවෙන් රු.42,000 ක ශිෂ්‍යාධාර හා සිව්වන කාර්තුව වෙනුවෙන් පමණක් සිසුන් 24 දෙනෙකු සඳහා රු.90,000 ක ශිෂ්‍යාධාර ගෙවා නොතිබුණි. | ශිෂ්‍යාධාර ලබාදීමට ඔවුන් වෙත යවන ලද පොදු 35 වවුචර්පත අත්සන්කර වැඩි පිරිසක් නැවත ඉදිරිපත් කළ ද , සුළු පිරිසක් නියමිත කාලය තුළ එවීම සිදු නොකරේ. වවුචර්පත් කඩිනමින් ලබාදෙන ලෙස නිරතුරුව දැනුවත් කිරීම් කර ඇත. වර්තමානය වන විට මෙම තත්වය අඩුකරගෙන ඇති අතර ඉදිරියේදීත් කටයුතු කරමි. | වියිමත් ලෙස නියමිත කාලය තුල ශිෂ්‍යාධාර ගෙවීම් කටයුතු සිදුකළ යුතුය. |
| (iii) විශ්ව විද්‍යාලයන්හි ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීමේ කටයුතු ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත රාජ්‍ය විශ්ව විද්‍යාල 17ක් අතුරින් විශ්ව | විශ්වවිද්‍යාල 10 ක ශිෂ්‍යාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන අතර දෘශ්‍යාබාධිත සිසුන් නොමැති විශ්වවිද්‍යාල සඳහා වැඩසටහන | කාලීන අවශ්‍යතාවයන් මත ශිෂ්‍යාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| විද්‍යාල 06කට පමණක් සීමා වී තිබුණි. තවද, පහ වසර ශිෂ්‍යත්වය සමත් ශිෂ්‍ය ,ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාරයක් ලබාදීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි | ක්‍රියාත්මක නොවේ. 1 වසර සිට අ.පො.ස. (සා.පෙළ) දක්වා ශිෂ්‍යාධාර වැඩසටහන තුළින් 5 වසර ශිෂ්‍යත්වලාභීන් ද ආවරණය වේ. කෙසේ වුවත් ඒ සඳහා විශේෂ ශිෂ්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කරමි. | |
| (ආ) 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 7 වගන්තිය ප්‍රකාරව අරමුදල සඳහා රජයේ ප්‍රතිපාදන වලට අමතරව , දේශීයව හෝ විදේශ වලින් ලැබෙන ප්‍රදාන , ත්‍යාග හෝ පරිත්‍යාග, උපලබ්ධි හෝ එකතු කරන මුදල් සහ අරමුදලේ ආයෝජනවලින් ලැබෙන ආදායම හෝ අරමුදලට අයවිය යුතු හෝ වෙනත් මුදල් මඟින් අරමුදල් සම්පාදනය කර ගැනීමට නෛතික ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් අරමුදල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 28ක කාලපරිච්ඡේදය තුල අරමුදල වර්ධනය කරගැනීම වෙනුවෙන් රජයේ ප්‍රදාන වලට අමතරව අනෙකුත් අරමුදල් ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | අරමුදල සඳහා ප්‍රධාන මූල්‍ය ප්‍රභවය වන්නේ රජයෙන් ලැබෙන ප්‍රදානයන්ය. ආදායම් උත්පාදනය වෙනුවෙන් සීදූව වෘත්තීය පුහුණු ආයතනය පවත්වාගෙන ගිය දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය අලාභ ලැබීම හා පරිපාලන හේතුනිසා වසා දමන ලදී. ඕනෑම තැනැත්තෙක් හට අරමුදල වෙත පරිත්‍යාග ලබා දීමේ හැකියාව ඇත. ඒ අනුව 2021 වර්ෂයේදී රු.100,000ක පරිත්‍යාග ලැබී තිබුණි. ආයෝජන ආදායම් ලබාගැනීමේ අරමුණින් බැංකු ජංගම ගිණුමේ අතිරික්තව ඇති රු.2,000,000ක මුදල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. වෙනත් ප්‍රභවයන්ගෙන් අරමුදල් සම්පාදනය සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඉදිරි සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. මහා භාරකාර දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වන පුද්ගල අරමුදල් භාර හා දේපල භාරයන්වල ප්‍රතිලාභ ගෙවීම් තුළින්ද අරමුදල් රැස්කර ගැනීමට අවධානය යොමු කරමි. | අරමුදල වර්ධනය කරගැනීම සඳහා පනතේ 07වන වගන්තියේ දැක්වෙන පරිදි අනෙකුත් ආදායම් ප්‍රභවයන් තුලින් අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ කාර්යය සාධනය පහත දැක්වේ.

| ක්‍රියාකාරකම/ වැඩසටහන | අයවැය ප්‍රතිපාදනය | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | තථ්‍ය උපයෝජනය | පහසුකම් සැපයූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2021 දෙසැම්බර් 31 දිනට කාර්යය සාධන ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය | භෞතික |
| | රු. | | රු. | | | |
| ක්‍රීඩා ආධාර | 100,000 | 15 | 12,000 | 02 | 12 | 13 |
| වෘත්තීය පුහුණුව | 450,000 | 05 | 122,000 | 03 | 27 | 6[illegible] |
| අධ්‍යාපන හා සංස්කෘතික ආධාර | 6,650,000 | 425 | 6,199,555 | 360 | 93 | 8[illegible] |
| පුනරුත්ථාපන ආධාර | 950,000 | 15 | 952,187 | 11 | 100 | 7[illegible] |
| අක්ෂි කාච/ වෛද්‍යාධාර | 250,000 | 08 | 46,950 | 03 | 19 | 3[illegible] |
| සුදු සැරයටි දිනය සැමරීම | 1,300,000 | 300 | 0 | 0 | 0 | [illegible] |
| **එකතුව** | 9,700,000 | | 7,332,692 | | | |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෘශ්‍යාබාධිතයන්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම යටතේ අරමුදලේ අරමුණු හා කාර්යයන්ගෙන් බැහැර ස්වං රැකියා ආධාර ලබාදීම විදුලිය සැපයීම සඳහා ආධාර ලබාදීම සංගීත භාණ්ඩ ලබාදීම යනාදී කටයුතු සඳහා රු.235 650 ක් වැයකර පුනරුත්ථාපන ආධාර සහ සංස්කෘතික ආධාර ලබාදීම් ලෙස දක්වා තිබුණි | දෘශ්‍යාබාධිතයන්ගේ සුභසාධනය අරමුණු කරගෙන අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබාදීමට කටයුතු කරන අතර පසුකාලීනව ආබාධිත පුද්ගලයන් මානසික වශයෙන් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රීඩා පරිගණක හා භාෂා පිළිබඳ පුහුණුව ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. කොවිඩ් වසංගතය හේතුවෙන් ස්වං රැකියා ආධාර නිවාස වලට විදුලිය හා ජලය ලබා ගැනීම සඳහා ආධාර ලබාදීමට ද කටයුතු කෙරුණි. | අරමුදලේ අරමුණු හා කාර්යභාරයන් ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිත ප්‍රජාවට සුභසාධනය සැලසීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල ස්ථාපිත කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 28ක කාලය තුල, රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණාත්මක කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණු අතර, විධිමත් අනුමැතියකින් තොරව ලේකම් තනතුරේ රාජකාරී සමාජ සේවා නිලධාරියෙකු විසින් හා අනෙකුත් රාජකාරී තවත් නිලධාරීන් තිදෙනෙකුගෙන් ඉටුකර ගෙන තිබුණි. තවද, විධිමත් අනුමැතියකින් තොරව භාණ්ඩාගාරික කෙනෙකු පත්කරගෙන තිබුණි. | රාජකාරි ඉටු කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි ලේකම්, භාණ්ඩාගාරික තනතුරුවලට හා ගිණුම්කටයුතු සඳහා කළමනාකරණ සහකාර නිලධාරියෙකු පත් කර ඇති අතර අනුමත කළමනාකරණ සහකාර තනතුරට නිලධාරියෙක් ද පත් කර ඇත. | විධිමත් අනුමැතියක් ලබා ගෙන තනතුරුවල රාජකාරී ඉටු කිරීම සඳහා නිලධාරීන් පත් කිරීමට කටයුතු කළ යුතුය. |